# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2284/22 – 2022 ජුනි 16 වැනි බ්‍රහස්පතින්දා – 2022.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ සුළු කොට්ඨාසයේ, කිතල් ඇල්ල (69E) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇල්ල නගරය (න.මැ. මු.පි. 11) ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ELL/2021/315 සහ 2021.08.09 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම් :

01. **කැබලි අක්ෂර 'A' – කිනලන් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0455**

උතුරට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කිනලන් වත්ත (හි.පි. 225363 හි කොටසක්) (න.මැ.මු.පි. 11 හි 88 වැනි කැබැල්ලේ කොටසක්); නැගෙනහිරට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කිනලන් වත්ත (හි.පි. 225363 හි කොටසක්) (න.මැ.මු.පි. 11 හි 88 වැනි කැබැල්ලේ කොටසක්); දකුණට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කිනලන් වත්ත (හි.පි. 225363 හි කොටසක්) (න.මැ.මු.පි. 11 හි 88 වැනි කැබැල්ලේ කොටසක්) සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර බී සහ නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කිනලන් වත්ත (හි.පි. 225363 හි කොටසක්) (න.මැ.මු.පි. 11 හි 88 වැනි කැබැල්ලේ කොටසක්).

**එස්. එම්. චන්ද්‍රසේන,**
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/23/2020/CEB/66.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 06-0120

1A – G 36941 – 19(2022/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*